# උගන්වනවා වෙනුවට ඉගෙනගන්න දෙනවා 2024න් පසුව ශිෂ්‍යත්වය මැරිල යයි ‘ක්‍රෙඩිට්’ එක්ක පෙරට යන ‘මොඩියුල්’ ක්‍රමයක් දක්ෂ නම් වසරකට කලින් සා/පෙළ ලියන්න පුළුවන්




එතෙක් මෙතෙක් නොවූ ආකාරයේ ප්‍රතිසංස්කරණ දාමයක් අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීමට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය සැලසුම් කර තිබේ. ඒ සඳහා වන ක්‍රමවේදයන් සියල්ල මේ වන විට තීරණය කර අවසන් ය. මෙකී සමස්ත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පිළිබඳව එම අමාත්‍යාංශ ලේකම් ආචාර්ය උපාලි සේදර සමග කළ සාකච්ඡාවකි මේ. ආචාර්ය උපාලි සේදර අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සඳහා පත් කළ ජනාධිපති කාර්ය සාධක බළකායේ ප්‍රධානියා ද වෙයි.

**ප්‍රශ්නය - ඉදිරියේ දී පාසල් විෂය මාලා බරපතළ ප්‍රතිසංස්කරණයකට ලක් කිරීමට නියමිතයි. එම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වන ආකාරය ගැන කතා කළොත්...**

පාසල් විෂය මාලාව ගැන අපි විශාල අධ්‍යයනයක් කළා. දැනට පවතින විෂය මාලාව වෙනස් විය යුත්තේ කෙසේද යන්න ගැන දීර්ඝ කාලයක් සාකච්ඡා කළා. ඒ අනුවයි කළ යුතු ප්‍රතිසංස්කරණ තීරණය කළේ. දැන් කියනවානේ දරුවන්ගේ පොත් මල්ල බර වැඩියි විෂය කරුණු බර වැඩියි කියලා. දීර්ඝ කාලයක් තිස්සේ පවතින චෝදනාවක් ඒක. දැනට ක්‍රියාත්මක වෙන්නේ කටපාඩම් කරන ක්‍රමයක්. ඒ ගැන විශේෂ අවධානය යොමු කරලා කුසලතා පාදක විෂය මාලාවක් නිර්මාණය කරන්න අපි තීරණය කළා. ඉදිරියේදී කටපාඩම් කිරීමේ ක්‍රමයට තිත තබා දරුවන්ගේ කුසලතාවටයි තැන ලැබෙන්නේ.

**ප්‍රශ්නය - මේ යටතේ විෂය උගන්වන ක්‍රමවේදයේ වෙනසක් වෙනවද?**

learning centers system එකකකටයි අපි යන්නේ. ළමයාට ඉගෙන ගන්න අවශ්‍ය දේවල් අපි දෙනවා. රියැදුරු අසුනේ ඉන්නේ ගුරුවරයා නෙවෙයි, ළමයයි. ළමයයි ඉගෙන ගන්නේ. ඒ සඳහා මොඩියුල් ක්‍රමයක් අපි හඳුන්වා දෙනවා. මොඩියුල ක්‍රමයක් කියන්නෙ මේකයි. වසරකට දින 210ක් පාසල් පවත්වනවා. සතියට දින පහයි. සති 42ක් පාසල් පවත්වනවා. වාර තුනට බෙදුවම සති 14 බැගින් එනවා. ඒ සති 14ට

විශ්වවිද්‍යාලයේ කියන්නේ සෙමෙස්තරයක් කියලා. මොන නමක් කිව්වත් කමක් නැහැ. අවශ්‍ය වෙන්නෙ ඉගෙන ගැනීමයි. එක් වාරයක දී ළමයින් කොපමණ පැය ගණනක් අධ්‍යාපනය ලැබිය යුතු ද යන්න ගැන අපි අධ්‍යයනය කළා. එක් මොඩියුලයක් දිනකට පැය බැගින් ළමයෙක් සති 10 ක් ඉගෙන ගත්තා නම් එක් මොඩියුල් එකක් ලෙස නම් කරනවා. ඒකට කියන්නේ එක ක්‍රෙඩිට් පැයක් ලැබෙනවා කියාලා. ඒ විධියට ක්‍රෙඩිට්වලින් තමයි යන්නේ. සති 10ක් කියන්නේ අවම කාලය. මේ ක්‍රමය කියන්නෙ authentic learning system කියලා කියන්නේ. සිංහලෙන් කියන්නේ සුතත්‍ය ඉගෙනීම කියලා. එහි අනෙක් පැත්ත තමයි අතත්‍ය ඉගෙන ගැනීම නැත්නම් vitual learning කියලා.

**ප්‍රශ්නය - මේ ක්‍රමය යටතේ දරුවන්ගෙ හිස මත තැබෙන දරාගත නොහැකි අධ්‍යාපනයේ බර සැහැල්ලු වෙයිද?**

අධ්‍යාපනය කියන්නේ ළමයා තුළ තියෙන දේ එළියට ගැනීමයි. දැන් වෙන්නේ ඒක නෙවෙයි. දැන් වෙන්නේ ළමයගේ ඔළුවට බර පටවන එකයි. අපි මෙතෙක් කල් විරුද්ධ පැත්තට ගිහිල්ලා තියෙන්නේ. දැන් අපි කරන්න හදන්නේ ළමයින්ට ඉගෙන ගන්න දෙන එකයි. ඒ සඳහා අවශ්‍ය වටපිටාව සකස් කිරීමයි. උදාහරණයක් ලෙස ගෙදරදීම ක්ෂුද්‍ර ජීවීන් ගැන ඉගෙන ගන්න පුළුවන්. පාන් කැල්ලක් පරණ වෙද්දි පුස් අල්ලනවා දැකලා කොහොමද මේක වෙන්නේ කියලා ප්‍රශ්න කරලා ඉගෙන ගැනීමේ ක්‍රමයකුයි ඉදිරියට එන්නේ. හැම වෙලාවෙම ප්‍රශ්න තමයි. ඒ ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගැනීම අසීරු නැහැ. නොදන්නා ළමයින්ට වෙනම ඉගෙන ගන්නත් අවශ්‍ය පහසුකම් සලසනවා. තොරතුරු අන්තර්ගත කරලා content boxes ළමයින්ට දෙනවා. අවශ්‍ය සියලු විස්තර එහි පවතිනවා. එවන් අධ්‍යාපනයක් කරා තමයි ඉදිරියට ගමන් කරන්නේ.

**ප්‍රශ්නය - විෂය නිර්දේශ වෙනස් වෙන්නේ කොහොමද?**

එක් ශ්‍රේණියක ඉන්න ළමයි සියලු දෙනා දැන් ඉගෙන ගන්නේ එකම පොතක්. නව ක්‍රමයට අනුව එකම ශ්‍රේණියේ විෂය නිර්දේශය කොටස් තුනකට වෙන් කරනවා. පළමු කොටස essential learning component ලෙස නම් කරනවා. එම කොටස සියලු සිසුන්ට අනිවාර්යයයි. එම අනිවාර්ය කොටසට විෂය නිර්දේශයෙන් සියයට පනහක් වෙන් කරනවා. ඉතිරි සියයට පනහෙන් සියයට තිහක් ළමයින්ගෙ දක්ෂතා හා කැමැත්ත මත තෝරා ගත හැකියි. ළමයින්ගේ කුසලතා, දක්ෂතා සහ හැදියාවන් ලෙස අපි මොඩියුල් වර්ග කිරීමක් කරනවා. ඒ මොඩියුල ළමයින්ට කැමති ලෙස තෝරාගත හැකියි. නිදසුනක් ලෙස රත්නපුරේ ළමයකුට මැණික් ගැන ඉගෙන ගැනීමට අවශ්‍ය නම් මොඩියුල් තියෙනවා. තේ ගැන ඉගෙන ගන්න අවශ්‍ය නම් ඒ සඳහාත් මොඩියුල් සකස් වෙනවා.

**ප්‍රශ්නය - ඉතිරි සියයට විස්ස**

ඉතිරි සියයට විස්ස වෙන් කෙරෙන්නේ ශාරීරික අධ්‍යාපන, ක්‍රීඩා හා ව්‍යායාම වැනි කටයුතු වෙනුවෙන්. ඒක සියලු සිසුන්ට අනිවාර්යයයි. දැන් සෞඛ්‍ය විෂයයත් නවය ශ්‍රේණියෙන් පසු අවසන්. ක්‍රීඩා කටයුතුත් අනිවාර්ය නැහැ. ඒ සියල්ල අනිවාර්ය කරනවා. ඒ වගේම සිසුන්ට තමන්ගේ පෞරුෂය සකස් කර ගැනීම සඳහාත් ඉඩක් වෙන්වෙනවා. ඒ ටික කරලා අවසන් වෙද්දි ළමයින්ගේ සිත් සැහැල්ලු වෙයි. මේ නව

ක්‍රමයෙන් ටියුෂන් ක්‍රමයට ඉඩක් නැති වෙනවා. පාසල් පාදක ඉගෙනීමට වැඩි ඉඩක් ලැබෙනවා. පාසල් පාදකවම දරුවන්ගේ හැකියා දක්ෂතා හඳුනා ගැනීමේ ක්‍රමයක් නිර්මාණය වෙනවා. විෂය මාලාවම පුළුල් පෙරළියකට ලක් වෙනවා.

ප්‍රශ්නය - කොයි කාලෙද පටන් ගැනෙන්නේ.

සමස්තයක් වශයෙන් 2023 තමයි පටන් ගන්න තියෙන්නේ.

ප්‍රශ්නය - පටන් ගන්නේ කුමන ශ්‍රේණිවලින් ද?

2022 දී තෝරා ගත් පාසල් කිහිපයක නියමු ව්‍යාපෘතියක් පටන් ගන්නවා. පළාත් නවයෙන්ම තෝරා ගත් පාසල්වල මාධ්‍ය තුනෙන්ම මෙම නව ක්‍රමය අත්හදා බැලෙනවා. සියලුම පාසල්වල එකවර පටන් ගැනීම අමාරුයි. වැරදි හදාගෙනනේ ඉදිරියට යන්න ඕනැ. ජාතික විභාගවලට පෙනී සිටින දරුවන් මෙම නියමු ව්‍යාපෘතියට අදාළ වෙන්නෙ නැහැ.

ප්‍රශ්නය - නියමු ව්‍යාපෘතියට පාසල් කීයක් අයත් වෙනවාද

පාසල් 120ක් පමණ ඒ සඳහා යොදා ගැනෙනවා. නියමු ව්‍යාපෘතිය 1, 2, 6, 8 සහ 9 යන ශ්‍රේණිවල පටන් ගන්නවා. සමහර විට 10 ශ්‍රේණියෙත් පටන් ගන්න හැකි වෙයි. 10 ශ්‍රේණියත් ගන්නවා ද කියලා ඉදිරි සති දෙකේ දී තීරණය කරනවා.

ප්‍රශ්නය - නව ක්‍රමයට සාමාන්‍ය පෙළ විභාගය පැවැත්වීමට අපේක්ෂා කරන්නේ කවර වසරේ සිටද?

මුලින්ම 2024 පවත්වන්නයි අපේක්ෂා කරන්නේ.

ප්‍රශ්නය - ජාතික අධ්‍යාපන ආයතනයේ මොඩියුල් කරන්න තරම් හැකියාවක් තියෙන මානව සම්පත තියෙනවාද?

එතැන ප්‍රශ්නයක් තිබුණා. ඒකට කළ පිළියම තමයි වසරක් මම ඒ අය පුහුණු කළා.

ප්‍රශ්නය - මොඩියුල් සකස් කරලා අවසන්ද?

තවම නැහැ. දැන් තමයි කරමින් යන්නේ.

ප්‍රශ්නය - දැන් පාවිච්චි කරන පෙළ පොත්වලට මොකක්ද වෙන්නේ...

දැන් තියෙන පෙළ පොත අයින් වෙනවා. නව ක්‍රමය අනුව ළමයින්ට ලැබෙන්නේ වැඩ පොත් පමණයි. ඒ පොතේම වැඩ කරන්න පුළුවන්. වාරෙන් වාරෙට වැඩ පොත් ලැබෙනවා.

ප්‍රශ්නය - පාසල් පවත්වන කාලය වෙනස් වෙනවාද

කාලය වෙනස් කිරීමේ අදහසක් නැහැ. නමුත් විනාඩි හතළිහක දැනට ක්‍රියාත්මක කාලච්ඡේදයක කාලය පැයක් ලෙස වෙනස් කරනවා. විනාඩි හතළිහෙන් කරන්න දෙයක් නැහැ. ළමයින්ට වාරයකට ක්‍රෙඩිට් විස්සක් ලබා ගැනීමට අවස්ථාව ලැබෙනවා. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම සඳහා 9, 10 සහ 11 යන ශ්‍රේණිවලදී අවම වශයෙන් ක්‍රෙඩිට් 180ක් සම්පූර්ණ කර ගැනීම අනිවාර්යයි.

**ප්‍රශ්නය - ඒ අවශ්‍යතාව සපුරා නොමැති දරුවන්**

දුර්වල දරුවෙක් නම් ක්‍රෙඩිට් එකක දෙකක ප්‍රශ්නයක් එන්න පුළුවන්. එවැනි දරුවන්ට විභාගයට පෙනී සිටීමට තවත් කාලයක් ගන්න වෙයි. දක්ෂ දරුවන්ට ඉක්මනින් ම ක්‍රෙඩිට් 180 සම්පූර්ණ කර ගැනීමට හැකි වෙයි. එවැනි දරුවන්ට වසරකට කලින් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටිය හැකියි. දැන් තිබෙන ක්‍රමය යටතේ කැමති වුණත් නැතත් විභාගයට පෙනී සිටිය යුතුයිනේ.

**ප්‍රශ්නය - උසස් පෙළ වෙනස්වීම් වෙන්නේ කොහොමද**

උසස් පෙළට ප්‍රතිසංස්කරණ අදාළ වෙන්නේ 2025 වසරේ නිසා තවම සම්පූර්ණයෙන් අත ගැහැව්වෙ නැහැ. නමුත් යම් යම් තීරණ ගෙන තිබෙනවා. ඒ අතරින් එකක් තමයි ක්‍රීඩාව අනිවාර්ය කිරීම. ඒ වගේම පරිගණක හැකියාව. එවැනි අමතර ක්‍රියාකාරකම් නොකර ‘ඒ’ තුනක් ගත්තත් විශ්වවිද්‍යාලයේ යන්න ලැබෙන්නේ නැහැ. උසස් පෙළ සිසුන්ටත් මූලික කුසලතා හඳුන්වා දෙනවා. ඒ කුසලතා සම්පූර්ණ කර ගැනීම අනිවාර්ය වෙනවා.

**ප්‍රශ්නය - ප්‍රතිසංස්කරණවලදී ආබාධිත දරුවන් ගැන අවධානය යොමු කළාද...**

අනිවාර්යයෙන්ම. එවැනි දරුවන්ට දැන් පාසල්වල කරන්න දේවල් නැහැනේ. පහසුකම් නැති නිසා.

**ප්‍රශ්නය - එදා සිටම තවමත් පහසුකම් නැහැනේ...**

ඒ පහසුකම් සැලසිය යුතුයි. දැන් ජාතික පාසලක් කියලා කියන්න නිර්ණායක මොනවද කියලා අ ැහැව්වොත් කවුරුත් දන්නේ නැහැනේ. ජාතික පාසලක් වීම සඳහා අවශ්‍ය නිර්ණායක ඉක්මනින්ම සකස් කරනවා. පාසලකට අවශ්‍ය අවම පහසුකම් ගැනත් සඳහන් කරනවා.

**ප්‍රශ්නය - ජාතික පාසල් දහසට අදාළව ඒ පහසුකම් ලැබෙයිද...**

ජාතික පාසල් දහසක් නෙවෙයි, ජාතික පාසල් 1169ක් දක්වා වැඩි වෙනවා. එම පාසල්වලට පෝෂිත පාසල් කියලා අවට පාසල් එක්වෙනවා. අවට ඉන්න දරුවන්ට පහසුකම් සහිත පාසලකට යන්න ඉඩ ලැබෙනවා.

**ප්‍රශ්නය - මේ ප්‍රතිසංස්කරණ වෙනුවෙන් මහජනතාවගේ අදහස් විමසීමක් කෙරෙනවාද?**

‘වියත් මග’ සාකච්ඡා පැවැත්වූ කාලෙේ සිටම මහජන අදහස් ලබා ගත්තා. තවදුරටත් මහජන අදහස් විමසීමක් කෙරෙනවා. පළාත් මට්ටමින් පවත්වන සාකච්ඡාවලදිත් මහජනතාවට අදහස් දක්වන්න පුළුවන්. ඒ වගේම වෙබ් පිටුවක් තියෙනවා අදහස් දෙන්න. ෆේස්බුක් පිටුවක් වගේම අවශ්‍ය නම් ඊමේල් කරන්නත් හැකියාව තිබෙනවා.

ප්‍රශ්නය - සාමාන්‍ය පෙළ විභාගය සමත් ද අසමත් ද කියලා කියන්න සම්මත තත්ත්වයන් තියෙනවා. ඒ ක්‍රමය වෙනස් වෙනවාද

ඉදිරියේ දී වෙනස්කම් කිහිපයක් වෙනවා. හතර වැනි ශ්‍රේණියේදී ජාතික මට්ටමේ තක්සේරුවක් කරන්න යෝජනා කරනවා. ප්‍රාථමික කාලය අවසන් කරන්න කලින් ළමයින්ගේ නියම තත්ත්වය දැන ගත යුතුයි. හතර වැනි ශ්‍රේණියේදී නියම තත්ත්වය දැන ගත්තම ඊළඟ වසරෙදි ඒ ළමයා ගොඩනැගීමේ වගකීම ගුරුවරු භාර ගත යුතුයි. ඒ නිසයි හතර වැනි ශ්‍රේණියෙේදි තක්සේරුවක් කරන්නෙේ. ඊළඟට අටවැනි ශ්‍රේණියේදී තවත් ජාතික මට්ටමේ තක්සේරුවක් කරනවා ළමයා ඉන්නෙ කොහෙද කියලා බලා ගන්න. සාමාන්‍ය පෙළ විභාගයට අදාළවත් වෙනස්කම් වෙනවා.

ප්‍රශ්නය - එතකොට පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ වෙනසක් වෙනවාද

සියලුම ළමයින්ට වෙන වෙනම profile එකක් හැදෙනවා. දෙමවුපියන්ටත් බලන්න හැකියාව තියෙනවා. ඒ අනුව වසර හතරක් පහක් දත්ත ඇතුළත් කරද්දි දරුවන්ගේ මට්ටම් ගැන දැන ගන්න හැකි වෙනවා. ඒවා ගැන හොයන්න වෙනම ශිෂ්‍යත්ව විභාග පවත්වන්න අවශ්‍ය නැහැ.

ප්‍රශ්නය - ශිෂ්‍යත්ව විභාගය පවත්වන අරමුණු තියෙනවානේ.

ජාතික පාසල් 1169ක් හදලා ඒවාට ඉල්ලුමත් හැදුවට පස්සේ ශිෂ්‍යත්ව කියන ගැටලුව එන්නේ නැහැ.

ප්‍රශ්නය - ඒ කියන්නේ 2024න් පසු ශිෂ්‍යත්ව විභාගයක් පැවැත්වීමේ අවශ්‍යතාවක් නැහැ...

ශිෂ්‍යත්වය නිකම්ම මැරිලා යයි. ළමයින්ට අවශ්‍ය වෙන්නෙ හොඳ පාසල්නෙ. ඒ පහසුකම් ලැබෙයි.

ප්‍රශ්නය - ශිෂ්‍යත්ව විභාගය පැවැත්වීමේ අරමුණ ජනප්‍රිය පාසල් ලබාදීම විතරක් නෙවෙයි. දිළිඳු දරුවන්ට ශිෂ්‍යාධාර ලබා දීමට නව වැඩපිළිවෙළක් සැකසෙනවාද...

ශිෂ්‍යාධාර අවශ්‍ය දරුවන් පාසලේ දීම හඳුනාගැනීම සඳහා වෙනම වැඩපිළිවෙළක් සකස් කරනවා. එවැනි සිසුන් හඳුනාගන්න විභාග අවශ්‍ය නැහැ.

ප්‍රශ්නය - මහජන අදහස්වලින් පසු දැනට තීරණය කර තිබෙන ප්‍රතිසංස්කරණ යෝජනා වෙනස් වෙයි ද...

සාධනීය යෝජනා අනිවාර්යයෙන් ම සලකා බලනවා.

ප්‍රශ්නය - රටට නව අධ්‍යාපන පනතක අවශ්‍යතාවක් නැද්ද

පනතක් අවශ්‍ය නැහැ. අධ්‍යාපන ප්‍රතිපත්තියක් හදලා වසර පහෙන් පහට වෙනස් කිරීමයි හොඳ. මොකද පනතක් හැදුවොත් වෙනස් කරන්න අපහසු නිසා. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හදාගන යනවා.

ප්‍රශ්නය - විද්‍යා පීඨවල වෙනසක් වෙනවාද...

විද්‍යා පීඨ සියල්ල ජාතික අධ්‍යාපන ආයතනය යටතට පත් කරනවා.

ප්‍රශ්නය - ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් ඊට විරුද්ධයි නේද?

ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ට අවශ්‍ය වෙලා තියෙන්නේ විද්‍යාපීඨ, විශ්වවිද්‍යාල බවට පත් කර ගැනීමයි. විශ්වවිද්‍යාලවල පවතින නිදහස ලබා ගැනීමත් ඒ අයගේ අරමුණක්. විශ්වවිද්‍යාලයක දේශනයක් කරන දේශකයෙක් යළිත් සොයා ගැනීම පහසු නැහැ. එහෙම කරන්න පුළුවන්ද වෘත්තීය පාසල්වල. අපිට අවශ්‍ය වෘත්තීය විශ්වවිද්‍යාල හදන්නයි. විශ්වවිද්‍යාලවල ඉන්න උපාධිධාරීන් වගේ ගුරුවරු හැදුවොත් මේ තියෙන පාසලත් අපිට නැති වෙනවා.

ප්‍රශ්නය - විද්‍යාපීඨ ජාතික අධ්‍යාපන ආයතනය යටතට ගැනීම සඳහා නීතිමය බාධාවක් නැද්ද...

ඒ සඳහා අපි නීතිපතිවරයාගෙන් උපදෙස් අරන් තියෙන්නේ. විද්‍යාපීඨ ජාතික අධ්‍යාපන ආයතනය යටතට පත් කිරීමේ කිසිදු ගැටලුවක් නැහැ.

•සාකච්ඡා කළේ - නිලන්ත මදූරාවල

මෙම ප්‍රතිසංස්කරණ සඳහා මහජනතාවට ද යෝජනා ඉදිරිපත් කළ හැකිය. ඒ වෙනුවෙන් info@edureforms.cloud යන ඊමේල් ලිපිනයද National education reforms iy National education reforms interest group යන මුහුණු පොත් පිටුද වෙන් කර ඇත.

ආචාර්ය උපාලි සේදර